**සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම - 2024**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | ගල් අඟුරු මිලදී ගැනීම්වලින් කොටසක් මූල්‍යකරණය කිරීම සඳහා රු. මිලියන 22,000 ක සහ රු. මිලියන 27,500 ක භාණ්ඩාගාර ඇපකරයක් හරහා සමාගම විසින් 2024 වර්ෂයේදී ලංකා බැංකුවෙන් පිළිවෙලින් රු. මිලියන 9,825 ක සහ රු. මිලියන 21,000 ක (චක්‍රීය පහසුකම) කෙටි කාලීන ණය පහසුකම් 2 ක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, එස්.එල්.එෆ්.ආර්.එස් 07, මූල්‍ය උපකරණ - හෙළිදරව් කිරීම් හි 14 වන ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනවල එම ණය සහ භාණ්ඩාගාර ඇපකර පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | එස්.එල්.එෆ්.ආර්.එස් 07 හි අවශ්‍යතාවයන්ට අනුකූලව, මෙම උපකරණවල ස්වභාවය, නියමයන් සහ ආශ්‍රිත අවදානම් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| ආ) | එස්.එල්.එෆ්.ආර්.එස් 09, මූල්‍ය උපකරණ හි 5.5.15 (අ) වගන්තිය අනුව, එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි විෂය පථය තුළ ඇති ගනුදෙනුවලින් ප්‍රතිඵලයක් ලෙස ඇතිවන වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් හෝ ගිවිසුම් වත්කම් සඳහා, සමාගම විසින් සෑම විටම පාඩු දීමනාව ජීවිත කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවලට සමාන මුදලකින් මැනිය යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් රු. 28,248,085,451 ක වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන ගිණුම්ගත කර නොතිබුණි. තවද, රු. 1,497,429,268 ක් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවති බව නිරීක්ෂණය විය. | සමාගම විසින් එහි වෙළඳ ලැබිය යුතු මුදල් සාමූහිකව හානිකරණය සඳහා ඇගයීමට ලක් කර ඇත. ඇතැම් තනි තනිව සැලකිය යුතු තරමේ ලැබිය යුතු මුදල් සඳහා, මෙම ලැබිය යුතු මුදල් ඊට අනුරූප ගෙවිය යුතු මුදල් මගින් ආවරණය ලබන බැවින්, හානිකරණ සඳහා ප්‍රතිපාදන හඳුනාගෙන නොමැත. ඒ අනුව, හානිකරණ ගාස්තුවක් අවශ්‍ය වන පැහැර හැරීමේ අවදානමක් නොමැත. මෙම හානිකරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3.5.1 මූල්‍ය වත්කම් යටතේ අනාවරණය කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| ඇ) | එල්.කේ.ඒ.එස් 37, ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියෙහි 85 (අ) සහ (ආ) ඡේදවලට අනුව, සමාගම විසින් එක් එක් ප්‍රතිපාදන පන්තිය, බැඳීමේ ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමේ අපේක්ෂිත කාලය, එම පිටතට ගලා යාමේ මුදල හෝ කාලය පිළිබඳ අවිනිශ්චිතතාවයන් පිළිබඳ ඇඟවීමක් හෙළිදරව් කළ යුතුය. ප්‍රමාණවත් තොරතුරු සැපයීමට අවශ්‍ය වන විට, | එල්.කේ.ඒ.එස් 37, ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියෙහි 85 (අ) සහ (ආ) ඡේදවලට අනුකූලව, මෙම ප්‍රතිපාදනය 2025 අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල | ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | |
|---|---|
| 48 වන ඡේදයේ සඳහන් කර ඇති පරිදි අනාගත සිදුවීම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රධාන උපකල්පන සහ ඕනෑම අපේක්ෂිත ප්‍රතිපූරණයක මුදල, එම අපේක්ෂිත ප්‍රතිපූරණය සඳහා හඳුනාගෙන ඇති ඕනෑම වත්කමක මුදල සඳහන් කරමින් ආයතනයක් විසින් හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අසම්භාව්‍ය වගකීම් ලෙස හඳුනා ගැනීම වෙනුවට, මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කිරීමෙන් තොරව සමාගමට එරෙහිව ගොනු කර ඇති කම්කරු නඩුව පිළිබඳව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් සඳහා රු. 2,500,000 ක ප්‍රතිපාදනයක් ගිණුම්ගත කර තිබුණි. | අසම්භාව්‍ය වගකීම් යටතේ ද හෙළිදරව් කරනු ඇත. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | ගල් අඟුරු සම්බන්ධයෙන් සමාගමේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය වනුයේ ජැටිය දක්වා භාර දීමේදී දරන ලද සියලු පිරිවැය ඇතුළත් කරමින් ඉන්වොයිසිකරණ අරමුණු සඳහා මිල නියම කිරීමයි. ජැටියට ගල් අඟුරු භාර දීමෙන් පසු භාණ්ඩ හුවමාරුව ගැනුම්කරුට ලැබෙන බවත් එය ගැනුම්කරුට ඉන්වොයිස් කරන බවත් සලකනු ලබයි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට ජැටිය වෙත ලද රු. 656,866,545 ක් වටිනා ගල් අඟුරු මෙට්‍රික් ටොන් 15,795 ක් ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී වර්ෂය සඳහා ලාභය සහ වෙළඳ ලැබිය යුතු මුදල් එම අගයෙන් අඩුවෙන් දක්වා ඇත. | ලං.වි.ම සමඟ ඇති කරගත් අන්‍යෝන්‍ය ගිවිසුමට අනුව, ගොඩ බෑම සම්පූර්ණ කර ඇති ගල් අඟුරු නැව් බඩු තොගය සඳහා ගල් අඟුරු ජැටියට භාරදීමේදී දැරූ සියලු වියදම් මත පදනම්ව ගල් අඟුරු මිල නියම කරනු ලබයි. එම නැව් බඩු තොගය 2025 ජනවාරි 04 වන දින ගොඩ බෑම සම්පූර්ණ කර ඇති අතර එම දිනයේදීම ලං.වි.ම වෙත ඉන්වොයිස් කර ඇත. | සෑම ප්‍රසම්පාදනයකම ආදායම් හඳුනාගැනීමේ සංගතතාව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| ආ) | 2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 3 (ix) වගන්තියට අනුව, 2024 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන ඕනෑම බදු අය කළ හැකි කාල පරිච්ඡේදයක් සඳහා බදු අය කළ හැකි සැපයුම මත වැට් බදු ලෙස සියයට දහඅටක අනුපාතයක් යොදාගත යුතුය. කෙසේ වෙතත්, සියයට | යොමු කරන ලද නැව් බඩු තොග දෙක සඳහා රේගු ප්‍රකාශනයේ (CusDec) දිනය 2023 දෙසැම්බර් වූ අතර, සමාන නැව් බඩු තොග සඳහා ආදාන වැට් බදු අනුපාතය ලෙස සියයට 15 ක තාවකාලික සහ අවසාන වැට් බදු අනුපාතයක් සහ නිමැවුම් බද්ද යොදන ලදි. නැව් බඩු තොග දෙක ගොඩ බෑම සම්පූර්ණ කිරීම 2024 ජනවාරි මාසයේදී සිදු විය. | නැව් බඩු තොගය ගොඩ බෑ දිනය මත පදනම්ව නිමැවුම් වැට් බද්ද යෙදිය යුතු අතර ගිණුම් ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දහඅටක අනුපාතයක් යොදා ගැනීම වෙනුවට සමාගම විසින් 2024 පළමු කාර්තුවට අදාළ රු. 5,298,885,749 ක් වූ විකුණුම් ඉන්වොයිසි දෙකක් මත නිමැවුම් වැට් බද්ද ගණනය කිරීම සඳහා සියයට පහළොවක අනුපාතයක් භාවිතා කර තිබුණි. එමඟින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වැට් බදු රු. 158,966,573 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 පළමු කාර්තුව සඳහා වැට් බදු වාර්තාවේ වෙනස් වැට් බදු අනුපාත දෙකක් (සියයට 15 සහ සියයට 18) භාවිතා කිරීමට අපට නොහැකි බැවින්, ඒ අනුව මෙම නැව් බඩු තොග දෙක ඇතුළත් කිරීම සඳහා අප විසින් 2023 සිව්වන කාර්තුවේ උපලේඛන 01 (නිමැවුම් වැට් බදු) සංශෝධනය කර ඇත. | |
| ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා නැව් සංස්ථාව වෙත ගෙවිය යුතු ශේෂය රු. 555,445,825 ක් වූ අතර සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද තහවුරු කිරීම අනුව එය රු. 1,146,854,504 ක් විය. ඒ අනුව, වෙනස රු. 591,408,679 ක් වූ අතර එය 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල 25 වන සටහනෙහි සසඳා තිබුණි. කෙසේ වෙතත්, අදාළ පාර්ශවයන් සමඟ එකඟ නොවීම් හේතුවෙන් එම වෙනස ගිණුම්වලට ගලපා නොතිබුණි. | විගණන නිරීක්ෂණවල විස්තර කර ඇති පරිදි, 2024 දෙසැම්බර් 31 වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂයේ වෙනස සඳහා අයිතම හඳුනා ගනිමින් අපි සැසඳුම් ප්‍රකාශනයක් සකස් කර ඇත. බොහෝ අයිතම සාධාරණ හේතූන් මත ලංකා ගල් අඟරු සමාගම විසින් ගිණුම්ගත කර නොතිබූ අතර "බැඳීම් සහ හදිසි අවස්ථා" යන සටහන් අංක 24 යටතේ හෙළිදරව් කර ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනට වසර අවසාන ශේෂයන්හි පවතින විෂමතා විසඳීම සඳහා ලංකා ගල් අඟරු සමාගම සහ ලංකා නැව් සංස්ථාව දැනට සාකච්ඡා පවත්වමින් සිටී. | වෙනස නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| වෙළඳ ණයගැතියන් | 27,921.164,238 | 27,943,757,000 | 22,592,762 | 2024 දෙසැම්බර් 31 වන දිනට වසර අවසාන ශේෂයන්හි ඇති විෂමතා විසඳීම සඳහා ලංකා ගල් අඟරු සමාගම සහ ලං.වි.ම දැනට සාකච්ඡා පවත්වමින් සිටී. | සැසඳුම සකස් කර ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විෂයය** | **මුදල රු.** | **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| අ) වෙළඳ ලැබිය යුතු මුදල් සහ විවිධ ණයගැතියන් | 9,808,968 | ඉන්වොයිසි, සවිස්තරාත්මක උපලේඛණ සහ ශේෂ තහවුරු කිරීම් | **i. විවිධ ණයගැතියන් - රු. 9,808,968.00**<br>එම මුදල ආපසු අයකර ගත නොහැකි ජාතිය ගොඩනැගීමේ බදු සහ වරාය අධිකාරී බදුවලින් සමන්විත බව මූලික විමර්ශනවලින් හෙළිදරව් විය. මූලාශ්‍රය/ආරම්භය තහවුරු කර ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ. | අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| ආ) ගෙවිය යුතු ශේෂයන් | 87,335,359 | ඉන්වොයිසි, සවිස්තරාත්මක උපලේඛණ සහ ශේෂ තහවුරු කිරීම් | ii. රු. **84,771,789.21- නොබෙල් රිසෝසස් ඉන්ටර්නැෂනල් වෙත ගෙවිය යුතු**<br>මෙම ශේෂය ප්‍රධාන වශයෙන් ණයවර ලිපි වලංගු කාලය කල් ඉකුත්වීම හේතුවෙන් නොබෙල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගමෙන් අඩුවෙන් ලබාගත් මුදලකින් සමන්විත වේ. වෙනත් දේ අතර, කලක සිට ලං.වි.ම සමඟ හිඟව පැවති ගල් අඟුරු ආශ්‍රිත ගෙවීම් සහ කළමනාකරණ ගාස්තු සඳහා අප විසින් කරන ලද ඇතැම් හිමිකම් පෑම් හේතුවෙන් මෙහෙයුම් අවශ්‍යතා මත පදනම්ව ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් පියවීම සඳහා අරමුදල් භාවිතා කරන ලදි.<br>iii. රු. **2,563,569.68 - ගෙවිය යුතු ගිණුමේ ශේෂය** | |

| | | |
|---|---|---|
| | | ලං.වි.ම අභ්‍යන්තර විගණන ශාඛාව විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව, මෙම ගෙවිය යුතු ගෙවීම් 2018 සහ ඊට පෙර සිදු කරන ලද වැරදි ගිණුම්කරණ සටහන් හේතුවෙන් සිදු විය. ලං.වි.ම අභ්‍යන්තර විගණන ශාඛාව විසින් සපයන ලද නිර්දේශයන්ට අනුකූලව අප විසින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ඇත. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයෙන් (ලං.වි.ම) ලැබිය යුතු අවසාන වැට් බද්ද සහ අනෙකුත් ලැබිය යුතු මුදල් රු.197,452,711 ක් විය. කෙසේ වෙතත්, ලං.වි.ම එම ශේෂය ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම විසින් ලං.වි.ම සමඟ ඇති මෙම එකඟ නොවීම විසඳීමට පියවර ගෙන නොතිබුණි. එබැවින්, ඉහත ශේෂයේ අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත වේ. | මෙය රු. මිලියන 205 ක රේගු දඩ මුදල් ගැටළුවට අදාළ වේ. 2025 පෙබරවාරි 19 වන දින බලශක්ති අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී, ලංකා ගල් අඟුරු සමාගම (එල්.සී.සී) / ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම) විසින් එල්.සී.සී සහ ලං.වි.ම යන දෙපාර්ශවයේම අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතියට යටත්ව, ලංකා නැව් සංස්ථාවට (සී.එස්.සී) රු. මිලියන 80.90 ක මුදලක් ගෙවිය යුතු බවට නිර්දේශ කරන ලදි.<br><br>පසුව අධ්‍යක්ෂක මණ්ඩල දෙකම අවශ්‍ය අනුමැතීන් ලබා දී ඇති අතර, ලං.වි.ම විසින් සී.එස්.සී වෙත රු. මිලියන 80.90 ක අරමුදල් මුදා හැරීමට කටයුතු කරනු ඇත. සී.එස්.සී සහ එල්.සී.සී යන දෙපාර්ශවය විසින් සිදු කරන ලද ද්විගුණනය වූ වැට් බදු ගෙවීමක් නියෝජනය කරන බැවින්, රු. මිලියන 114.80 ක් වූ මුදල එල්.සී.සී හි පොත්වල ලං.වි.ම වෙතින් ලැබිය යුතු මුදල සී.එස්.සී වෙත ගෙවිය යුතු මුදලට එරෙහිව කපා හැරීමෙන් අභ්‍යන්තර ගිණුම්කරණ සටහනක් හරහා ගැලපිය යුතුය. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

ආ) සමාලෝචිත වර්ෂය අවසන් වූ දිනට ලං.වි.ම වෙතින් ලැබිය යුතු එකතුව රු. 103,769,024 ක ලැබිය යුතු ශේෂ තුනකට අදාළ ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට ලං.වි.ම මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එය සමාගමට ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත වේ.

රු.103,769,024 ක් වූ එම ලැබිය යුතු ශේෂය පහත ශේෂ තුනෙහි ඇතුළත් වේ.

01. ලං.වි.ම වෙතින් ලැබිය යුතු කළමනාකරණ ගාස්තුව - රු.99,106,390.00

ලං.වි.ම දැනටමත් හිඟ ලැබිය යුතු කළමනාකරණ ගාස්තුවෙන් රු. 30,676,370.00 ක් පියවා ඇත. අදාළ සියලු වියදම් ලං.වි.ම සම්බන්ධ ව්‍යාපාරික ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කර ඇති බැවින් ඉතිරි ශේෂය පිළිබඳව දැනට කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කරමින් පවතී.

02. ලං.වි.ම (කොටෙක්නා) වෙතින් ලැබිය යුතු විනිමය අලාභය – රු.51,632.00

පසුව, මෙම ශේෂය ලං.වි.ම විසින් පියවා ඇත. 2024 දෙසැම්බර් 31 දිනට, කොටෙක්නා ඉන්ස්පෙක්ෂන් ඉන්දියා පුද්ගලික සමාගමහි පියවීම හරහා ජනනය වූ විනිමය ලාභයකින් පැන නගින ලං.වි.ම වෙත ගෙවිය යුතු ශේෂයක් පවතී. මෙම මුදල කොටෙක්නා වෙත ගෙවිය යුතු ඊළඟට එළඹෙන පියවීමට එරෙහිව ගැලපීම් කරනු ඇත.

03. ලං.වි.ම වෙතින් ලැබිය යුතු ආදායම් බදු – රු. 4,611,002.00

එල්.සී.සී විසින් ලං.වි.ම වෙත ගල් අඟුරු බෙදා හැරීමෙන් ලාභයක් උපයා නොගන්නා බැවින්, ආදායම් බදු වියදම ද ලං.වි.ම වෙතින් ආපසු අයකර ගැනීමට සුදුසුකම් ලබයි. එල්.සී.සී විසින් මෙම ශේෂය ලං.වි.ම වෙතින් තහවුරු කරන ලෙස ඉල්ලා සිටියද මූල්‍ය ප්‍රකාශන අවසන් කරන ලද දිනට ඔවුන් එය තහවුරු කර නොමැත.

හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

| | | |
|---|---|---|
| ඇ) අයකර ගැනීමෙන් තොරව රු. 85,784,418 ක් වූ ලැබිය යුතු කළමනාකරණ ගාස්තු වසර 4 ක් තිස්සේ පැවතුනි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ගිණුම්ගත කර නොතිබුණි. | 2016, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ලං.වි.ම වෙතින් ලැබිය යුතු ශුද්ධ පොදු කාර්ය පිරිවැය ශේෂය පිළිබඳව විවාද පවතී. මේ වන විට හිඟ මුදල රු. 68,430,019.00 ක් වන අතර, මෙම ශේෂය ලං.වි.ම සමඟ ව්‍යාපාරික ගනුදෙනු අතරතුර දරන ලද වියදම්වලට සම්පූර්ණයෙන්ම අදාළ වන බැවින්, මෙම මුදල ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය එකඟතාවයකට පැමිණීමේ අරමුණින්, මෙම ගැටළුව විසඳීම සඳහා කළමනාකරණ මට්ටමින් සාකච්ඡා පැවැත්වෙමින් පවතී. | දීර්ඝ කාලීන හිඟ මුදල් අයකර ගැනීමට සහ සුදුසු හානිකරණ ප්‍රතිපාදනයක් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| ඈ) නැව් බඩු තොග අංක 123 සඳහා 2016 දී සමාගම විසින් රේගු වැට් බදු ලෙස රු.136,236,370 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගු ප්‍රකාශනයට (CusDec) අනුව, සත්‍ය වැට් බදු මුදල රු.106,969,404 ක් විය. ඒ අනුව, සමාගම විසින් රු.29,266,965 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය වූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩිපුර ගෙවන ලද රු.29,266,965.00 ක් වූ වැට් බදු වාර්තා කර ඇති බව එල්.සී.සී විසින් සොයා ගත් අතර නිකුත් කරන ලද නව තක්සේරුවට අනුව, 2019 මාර්තු 31 දිනට රු.26,306,145.00 ක අතිරික්ත ආදාන වැට් බදු පවතින බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කරන ලදි. එල්.සී.සී හි රේගුවට ගෙවිය යුතු හිඟ ශේෂයන්ට එරෙහිව මෙම ආදාන වැට් බදු පියවීමට එල්.සී.සී විසින් සුදුසු විධිමත් ක්‍රියාමාර්ග ගනු ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ඉ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, සමාගම විසින් සීමාසහිත ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී) සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් වෙතින් දිගුකාලීනව ලැබිය යුතු පිළිවෙලින් රු. 589,973,845 ක සහ රු. 244,834,171 ක ශේෂයන් අයකරගෙන නොතිබූ අතර, හානිකරණය සඳහා ප්‍රතිපාදන ගිණුම්ගත කර නොතිබුණි. තවද, සී.එස්.සී සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් විසින් එම ශේෂයන් තහවුරු කර නොතිබූ බැවින්, විගණනයට එවැනි ශේෂයන්ගේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | **i. ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු මුදල – රු. 589,973,845.00**<br><br>ලංකා නැව් සංස්ථාවෙන් (ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්) ලැබිය යුතු හිඟ මුදලේ වත්මන් තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් සමඟ සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය බලාගාරය සහ ලංකා ගල් අඟුරු සමාගම නියෝජනය කරන සිව් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදි. ලංකා නැව් සංස්ථාවේ | දීර්ඝ කාලීන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

මූලාශ්‍රවලට අනුව, සාකච්ඡා කමිටුවේ වාර්තාව වරාය සහ නාවික අමාත්‍යාංශය හරහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට යොමු කර ඇත. ලංකා ගල් අඟුරු සමාගම සහ ලං.වි.ම දැනටමත් ඔවුන්ගේ නිරීක්ෂණය විදුලිබල අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

මේ කාරණය සාකච්ඡා කිරීම සඳහා 2025 ජූනි 17 වන දින ඉහළ මට්ටමේ රැස්වීමක් පැවැත්වීමට නියමිත වේ. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල සී.කේ. පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වීම පැවැත්වේ.

**ii. ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් – රු. 244,834,171.00**

නඩු පිළිබඳ සාරාංශයේ සටහන් අංක 26 යටතේ හෙළිදරව් කර ඇති පරිදි, එල්.සී.සී විසින් 2021 දෙසැම්බර් 31 දින බේරුම්කරණයෙන් නියෝගයක් සහ/හෝ තීන්දුවක් ලබා ගත් අතර, ඉල්ලුම්කරුට (ලංකා ගල් අඟුරු සමාගමට) සියයට 3 ක වාර්ෂික පොලියක් සහ රු. මිලියන 10 ක බේරුම්කරණ පිරිවැය සමඟ එ.ජ.ඩො 1,575,141.86 ක් ගෙවීමට විත්තිකාරුට නියෝග කරන ලදි. එසේම, ඉහත කාරණය සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ තීන්දුව 2023 අගෝස්තු 08 වන දින එල්.සී.සී ට පක්ෂව ලබා දුන් අතර බේරුම්කරණ තීන්දුව බලාත්මක කිරීමට නියෝගයක් ලබා දෙන ලදි. නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් හි වත්කම් සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නීතිපතිවරයා 2023 නොවැම්බර් 06 වන දින එල්.සී.සී වෙත ලිපියක් යවා ඇත. එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ

කොමසාරිස්වරයා ලිබර්ටි කොමොඩිටීස් හි වත්කම් පිළිබඳ විස්තර නීතිපතිවරයා වෙත යවා ඇති අතර නීතිමය ක්‍රියාවලිය සිදුකරමින් පවතී.

වර්තමානයේදී, නීතිපති දෙපාර්තමේන්තුව විසින් බේරුම්කරණ විනිශ්චය සභාවෙන් ලද තීරණ ප්‍රකාශනය අනුමැතිය සඳහා වාණිජ මහාධිකරණයේ විනිසුරුවරයා වෙත ඉදිරිපත් කර ඇත.

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2025 අප්‍රේල් 09 වන දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් විස්තරවලට අනුව, කාර්තු පහක් සඳහා රු. 1,977,491,269 ක වැට් බදු දඩ මුදල ඇතුළුව ගෙවිය යුතු වැට් බදු මුදල රු. 5,364,274,802 ක් වසර තුනක් තිස්සේ පියවීමෙන් තොරව පැවතුනි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන හෝ හෙළිදරව් කර නොතිබුණි. | එය විසඳා ඇත. රේගුවේ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යන දෙඅංශයෙන්ම පද්ධති යාවත්කාලීන කිරීම ඉක්මනින් සිදුවනු ඇත, | පද්ධති යාවත්කාලීන කිරීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ආ) මුළු වෙළඳ ගෙවිය යුතු ශේෂයන් අතරින්, සීමාසහිත ලංකා නැව් සංස්ථාව සහ ලං.වි.ම (ලිබර්ටි සහ ටෝරියන් සඳහා) වෙත ගෙවිය යුතු පිළිවෙලින් රු. 473,620,987 ක සහ රු. 714,965,434 ක හිඟ ශේෂ දෙකක්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ පියවීමෙන් තොරව පැවතුනි. | අ. වසර 2 කට වැඩි සීමාසහිත ලංකා නැව් සංස්ථාව වෙත ගෙවිය යුතු හිඟ ශේෂයට පහත සඳහන් දෑ ඇතුළත් වේ.<br><br>i. මෙම ගෙවිය යුතු මුදල සඳහා අනුරූප ලැබිය යුතු මුදල ඉහත (අ) හි පිළිතුරේ සඳහන් ලං.වි.ම වෙතින් ලැබිය යුතු අවසාන වැට් බද්ද සහ අනෙකුත් ලැබිය යුතු මුදල් වන රු.197,452,711 ට අදාළ වේ සඳහන් කළ පරිදි, විෂමතාවය විසඳීම සඳහා කළමනාකරණ සංවාද දැනට සිදුකරමින් පවතින අතර, එල්.සී.සී සහ ලං.වි.ම අධ්‍යක්ෂක | එකඟ නොවීම් විසඳා ගැනීමට සහ ගෙවිය යුතු ශේෂය පියවීමට කටයුතු කළ යුතුය. |

මණ්ඩල අනුමැතිය මත පදනම්ව ලං.වි.ම වෙතින් අරමුදල් ලද පසු සී.එස්.සී වෙත ගෙවිය යුතු මුදල් පියවනු ඇත.

ii. නැව් බඩු තොග අංක 277 - සිලෝන් ප්‍රින්සස් එකඟ වූ ලැයිකාන් සීමාවෙන් ඔබ්බට ගොඩබෑමේ වරායට ළඟා වූ අතර දර්ශක වෙනස සඳහා සිදු කරන ලද ගණනය කිරීම මත පදනම්ව ලං.වි.ම රු. 127,580,461.49 ක් රඳවා තබා ගනී. මෙය එල්.සී.සී සහ ලං.වි.ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ද යොමු කරන ලද අතර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

iii. කළමනාකරණ සංවාද මත පදනම්ව, අදාළ පාර්ශවයන් විසින් තවමත් බඩු බෑමේ නියමිත කාලය (laytime) ගණනය කිරීම් සඳහා එකඟ වී නොමැති ගොඩබෑමේ වරාය සඳහා වන ප්‍රමාද ගාස්තුව සඳහා, 2023 ජනවාරි 04 වන දින ලං.වි.ම වෙතින් ලද අරමුදල්වලින් රු. මිලියන 107 ක අත්තිකාරම් ගෙවීමක් එල්.සී.සී විසින් සී.එස්.සී වෙත පියවා ඇත. 2021/2022 ගල් අඟුරු වාරය සඳහා සී.එස්.සී වෙත ගෙවිය යුතු ශේෂයෙන් රු. 145,261,997 ක් එල්.සී.සී විසින් රඳවාගෙන ඇති අතර, එම laytime ගණනය කිරීම් සඳහා අදාළ පාර්ශවයන් එකඟ වූ පසු සී.එස්.සී වෙත ගෙවිය යුතු මුදල් පියවනු ඇත.

iv. ලංකා නැව් සංස්ථාව විසින් කරන ලද වැරදි ප්‍රකාශනයක් හේතුවෙන්, ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකා රේගුවට නැව් බඩු තොග අංක 123 සඳහා රු. 29,266,966 ක් වැට් බදු සඳහා වැඩිපුර ගෙවා ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම

වැඩිපුර ගෙවූ වැට් බද්ද වාර්තා කර ඇති බව එල්.සී.සී විසින් සොයා ගත් අතර එල්.සී.සී විසින් රේගුවට ගෙවිය යුතු හිඟ ශේෂයන්ට එරෙහිව මෙම වැඩිපුර ගෙවූ වැට් බද්ද පියවීමට සුදුසු විධිවිධාන ගනු ඇත. ඉහත විධිවිධාන විසඳන තෙක් එල්.සී.සී විසින් ඊට සමාන සී.එස්.සී හි හිඟ මුදලක් රඳවා ගෙන ඇත. රු. 5,295,847 ක ශේෂය ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු මුදලට අදාළ වේ.

ආ. රු.714,965,434 : ලං.වි.ම (ලිබර්ටි සහ ටෝරියන්) වෙත ගෙවිය යුතු

මෙම ගෙවිය යුතු මුදල සඳහා ලං.වි.ම තහවුරු කිරීම අප වෙත ලද අතර සටහන අංක 11 යටතේ මෙම ගෙවිය යුතු ශේෂයට අනුරූප ලැබිය යුතු මුදල දැක්වේ. මුදල් ලද පසු ලං.වි.ම වෙත ගෙවිය යුතු අතර ගිණුම් අතර වෙනස ගිවිසුමට අනුව මිල ඉහළ යාම මගින් පැහැදිලි කෙරේ.

**1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 90 (1) වගන්තියට අනුව, "වාරික ගෙවන්නෙකු" වන පුද්ගලයෙකු තක්සේරු වර්ෂයක් තුළ ව්‍යාපාරයකින් හෝ ආයෝජනයකින් තක්සේරු කළ හැකි ආදායමක් ලබා ගන්නේ නම් හෝ ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, කාර්තුමය වාරික මගින් බදු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී සමාගම කාර්තුමය | එල්.සී.සී හි මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ ගල් අඟුරු බලාගාර සඳහා අවශ්‍ය ගුණාත්මකභාවයෙන් හා ප්‍රමාණයෙන් යුත් ගල් අඟුරු කාර්යක්ෂමව හා කාලීනව ප්‍රසම්පාදනය කිරීමයි. මෙය රටට අවම පිරිවැයකින් අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කරයි. තවද, ශුද්ධ පොදු කාර්ය පිරිවැය (එල්.සී.සී වෙත ලාභයක් හෝ අලාභයක් නොමැත) ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම) විසින් ප්‍රතිපූරණය කරයි.<br>පහත හේතු නිසා කාර්තුමය පදනම මත | දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| වශයෙන් වාරික ගෙවා නොතිබුණි. | (කාර්ය සාධන සුරැකුම් ආදියෙන්) පොලී ආදායම හඳුනාගත නොහැක.<br>(1) පොලී ආදායම ප්‍රධාන ආදායමද නැද්ද යන්න<br>(2) එසේ නොවේ නම්, වෙනත් ආදායම<br>(3) පොලී ආදායම ලං.වි.ම වෙත මාරු කරන්නේද යන්න<br>(4) ආදායමේ විචලනය<br>(5) විගණනය කරන ලද ගිණුම්<br>දේශීය ආදායම් පනතට අනුව, පොලී ආදායම ඇතුළුව සියලුම බදු බැදීම් නිවැරදිව තක්සේරු කර නියමිත දිනට පෙර ගෙවන බවට එල්.සී.සී සහතික විය යුතු අතර, අනාගතයේදී, නිරීක්ෂණය අනුව ක්‍රියාත්මක කිරීමට අප විසින් අවශ්‍ය පියවර ගනු ඇත. | |
| ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 (1) වගන්තියට අනුව, මෙම පනත යටතේ ආදායම් බදු අය කළ හැකි සෑම පුද්ගලයෙකුම (2) වන උපවගන්තියට අනුව සහකාර කොමසාරිස්වරයා වෙත, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් නියම කරනු ලබන එවැනි විස්තර අඩංගු නියමිත ආකෘතියේ බදු වාර්තාවක් නියමිත කාලය තුළ ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, පනතේ එම විධිවිධානවලට අනුකූලව සමාගම විසින් 2022/2023 සහ 2023/2024 තක්සේරු වර්ෂයන් සඳහා වාර්තා ගොනු කර නොතිබුණි. | 2022/23 සහ 2023/24 තක්සේරු වර්ෂය සඳහා අප විසින් දැනටමත් වාර්තා ඉදිරිපත් කර ඇත. | දේශීය ආදායම් පනතේ එම විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| ඇ) 2002 අංක 14 දරන අගය එකතු කළ බදු පනතේ 26(1) වගන්තිය (2014.01.01 දක්වා සංශෝධන ඇතුළත් කර ඇත) අනුව, ඕනෑම බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා බද්ද බදු අය කළ හැකි කාල සීමාව අවසන් වීමෙන් පසු මාසයේ විසිවන දිනට පෙර ගෙවිය යුතුය. කෙසේ වෙතත්, | මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3.8.1 – ආදායම් හඳුනාගැනීම – එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි දක්වා ඇති පරිදි, ආදායම් හඳුනාගැනීමේ සහ වැට් බදු ගොනු කිරීමේ බැඳීම්වල කාල වෙනස්කම් හේතුවෙන් වෙනස් ගිණුම්කරණ කාල පරිච්ඡේදවල වැට් බදු සහ ආදායම සඳහා ඉන්වොයිසි හඳුනාගත හැකිය. විශේෂයෙන්, | දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

එම විධිවිධානයට අනුව සමාගම වැට් බද්ද ගෙවා නොතිබුණි. 2024 දෙසැම්බර් 31 වන දිනට ගෙවිය යුතු රු. 554,171,424 ක් වන වැට් බදු තවමත් ගෙවා නොතිබුණි.

2022/2023 ගල් අඟුරු වාරය සඳහා කොරල් එනර්ජි ඩී.එම්.සී.සී ගිවිසුමේ නියමයන් යටතේ, ගෙවීම්වලින් සියයට 80 ක් ගල් අඟුරු භාවිතයට ගන්නා විට ගෙවිය යුතු වූ අතර, ඉතිරි සියයට 20 දින 120 කට පසු ගෙවිය යුතුය. එසේම 2021/2022 සහ 2022/2023 ගල් අඟුරු වාරවල පැවති විදේශ විනිමය සීමාවන් සැලකිල්ලට ගනිමින්, වැට් බදු වාර්තා ගොනු කරන අවස්ථාවේදී ගල් අඟුරු නැව් බඩු තොගවල වටිනාකම නිවැරදිව තීරණය කිරීමට අපට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආදාන වැට් බදු උපලේඛණ සඳහා තාවකාලික සංඛ්‍යා භාවිතා කරන ලදි. විස්තරාත්මක අභ්‍යන්තර සමාලෝචනයකින් පසුව, වැට් බදු වාර්තාවල වාර්තා කර ඇති විකුණුම් සහ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ආදායම අතර විෂමතාවන්ට මූලික හේතු අප විසින් දැන් හඳුනාගෙන ඇත. නිවැරදි කරන ලද සංඛ්‍යා පිළිබිඹු කිරීම සහ ගිණුම්කරණ වාර්තා සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා අදාළ වැට් බදු වාර්තා ඒ අනුව සංශෝධනය කිරීමට සමාගම අදහස් කරයි.

මීට අමතරව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2024/06/20 දිනැති නව තක්සේරුවක් නිකුත් කර ඇති අතර, 2019 පළමු කාර්තුව අවසන් වන දිනට රු. 26,306,145.00 ක අතිරික්ත ආදාන වැට් බද්දක් (1620 සිට 1910 දක්වා පිටපත් අමුණා ඇත) හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් සහ අනෙකුත් හිඟ බදු කරුණු සම්බන්ධයෙන් අප විසින් දේශීය ආදායම් දෙපාර්තමෙන්තුව සමඟ ක්‍රියාකාරීව සාකච්ඡා කරමින් සිටි. සංශෝධිත වැට් බදු ඉදිරිපත් කිරීම් පිළිගැනීමෙන් පසු සමාගම විසින් අවසාන වැට් බදු වගකීම පියවනු ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 84,444,941 ක ලාභයක් වූ අතර 2014 වර්ෂයේ සිට සමාගම විසින් දරන ලද ශුද්ධ පොදු කාර්ය පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීම හේතුවෙන් පෙර වර්ෂයේදී බඳු පෙර ශුද්ධ ලාභයක් හෝ අලාභයක් නොතිබුණි. මෙම වර්ධනයට පසුගිය වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ආදායම රු. 147,133,147 කින් වැඩිවීම සහ මූල්‍ය පිරිවැය රු. 20,920,030 කින් පිරිහීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම/වියදම් | 2024 රු. මිලියන | 2023 රු. මිලියන | වැඩිවීම/(අඩුවීම) රු. මිලියන | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ආදායම | 91,879 | 146,503 | (54,624) | (37.29) |
| විකුණුම් පිරිවැය | 91,879 | 146,428 | (54,549) | (37.25) |
| ලියාපදිංචිය සහ අනෙකුත් ආදායම් | 11 | 19 | (8) | (42.11) |
| පරිපාලන වියදම | 75 | 74 | 1 | 1.35 |
| මූල්‍ය ආදායම | 156 | 9 | 147 | 1633.33 |
| මූල්‍ය පිරිවැය | 7 | 28 | 21 | 75 |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියමිත කාල සීමාව තුළදී ගල් අඟුරු ගොඩබෑම සිදු නොකිරීම හේතුවෙන් සමාගම විසින් සැපයුම්කරුට ගොඩබෑමේ වරාය ප්‍රමාද ගාස්තුව ලෙස රු. 151,695,439 ක මුදලක් ගෙවා තිබුණි. එබැවින්, එම වියදම සමාගමට අනාර්ථික බව නිරීක්ෂණය විය. | සැපයුම්කරුවන්ට කරන සියලුම ගෙවීම් අදාළ අත්සන් කරන ලද ගිවිසුම්වල දක්වා ඇති නියමයන්ට අනුකූලව සිදු කරයි. මෙම ප්‍රතිපත්තිය ගොඩබෑමේ වරාය ප්‍රමාද ගාස්තුව සඳහා ද අදාළ වන අතර, දෙපාර්ශවයම බඩු බෑමේ නියමිත කාලය ගණනය කිරීම් සඳහා අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ පසුව පමණක් ගෙවීම පියවයි. ප්‍රමාද ගාස්තුව සම්බන්ධයෙන්, ප්‍රමාදයට හේතු සමාලෝචනය කර පිළිගැනීමෙන් පසුව මෙන්ම බඩු බෑමේ නියමිත කාලය ගණනය කිරීම | අසාමාන්‍ය ප්‍රමාදයන් සහ ප්‍රමාද ගෙවීම් අවම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | පිළිබඳ එකඟතාවයකට පැමිණීමෙන් පසුව ලං.වි.ම අරමුදල් නිකුත් කර ඇත.<br><br>නිරිතදිග මෝසම් සමය බටහිර වෙරළ තීරයට බලපාන බැවින්, ගල් අඟුරු සැපයුම් මෙහෙයුම් සැප්තැම්බර් සිට ඊළඟ වර්ෂයේ අප්‍රේල් දක්වා වූ මාස හතක කාලයකට සීමා වී ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ. මෙම සෘතුමය සීමාව ප්‍රමාදයකින් තොරව මුළු ගල් අඟුරු අවශ්‍යතාවය සුරක්ෂිත කිරීමේදී සැලකිය යුතු අභියෝගයක් ඉදිරිපත් කරයි. | |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2023/2024 සහ 2024/2025 වාරය සඳහා ගල් අඟුරු මෙට්‍රික් ටොන් 2,250,000 ක් සැපයීම සඳහා සමාගම විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා “බ්ලැක් සැන්ඩ් කොමොඩිටීස් එල්.එල්.සී.” ලංසුකරු තෝරාගෙන තිබූ අතර දෙපාර්ශ්වයම 2023 ඔක්තෝබර් 20 වන දින ගිවිසුමට එළඹ තිබුණි. ඉහත ගල් අඟුරු සැපයුම්කරු 2023/2024 වාරය සඳහා නැව් බඩු තොග 16 කින් මෙට්‍රික් ටොන් 914,495 ක් පමණක් සපයා තිබුණි. භූ දේශපාලනික ගැටළු හේතුවෙන්, සමාගමේ අවසාන කොටස් හිමියන් වන ජේ.එස්.සී සූඑක් (රුසියාව) මත සම්බාධක පැනවීය. ඉතිරි ප්‍රමාණය වන මෙට්‍රික් ටොන් 1,390,342 ක් සැපයීම සඳහා ඉහත සැපයුම්කරු විසින් පොටෙන්ෂියා එල්.එල්.සී. එෆ්. ඉසෙඩ් නම් කර තිබූ අතර, සමාගම (එල්.සී.සී) විසින් නම් කරන ලද සමාගමට ඉහත ගල් අඟුරු සැපයුම දිගටම කරගෙන යාමට අනුමැතිය ලබා දී තිබුණි. පසුව, 2024 මාර්තු 19 වන දින | | |

| | | | |
|---|---|---|---|
| | සමාගම සහ පොටෙන්ෂියා එල්.එල්.සී. එෆ්. ඉසෙඩ් අතර අතිරේක ගිවිසුමක් අත්සන් කරන ලදි. | | |
| (i) | පොටෙන්ෂියා එල්.එල්.සී. එෆ්. ඉසෙඩ් (නම් කරන ලද සැපයුම්කරු) විසින් තත්ත්ව ප්‍රමිතිකරණය හා මිනුම් උපදේශනය, ඉන්ධන, ග්‍රීස්, ලිහිසි තෙල් සහ තෙල් තොග වෙළඳාම යන ව්‍යාපාරික කටයුතු සඳහා ලියාපදිංචි වී තිබුණි. කෙසේ වෙතත්, ඉහත සැපයුම්කරු ගල් අඟුරු සැපයුම සඳහා ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි. | එල්.සී.සී විසින් අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද සියලුම අදාළ නීතිමය ක්‍රියා පටිපාටි සහ නියෝගවලට සම්පූර්ණයෙන්ම අනුකූල වී ඇත. පොටෙන්ෂියා එල්.එල්.සී ආදේශ කිරීම සහ පත් කිරීම නීතිපතිවරයාගේ උපදෙස් අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පමණක් සිදු කරන ලදි. කොන්ත්‍රාත් ගිවිසුම හෝ ලබා දී ඇති අනුමැතීන්වල පැවරුම්ලාභියාගේ සුදුසුකම් හෝ පූර්ව අත්දැකීම් ඇගයීම සඳහා කිසිදු සඳහනක් කර නොමැත. එබැවින්, සම්මත ගල් අඟුරු සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ දක්වා ඇති නිර්ණායක මෙම අවස්ථාවේදී අදාළ නොවේ. | සෑම ප්‍රසම්පාදනයකදීම සැපයුම්කරුගේ පූර්ව සුදුසුකම්, පළපුරුද්ද සහ හැකියාව ඇගයීමට ලක් කළ යුතුය. |
| (ii) | ඉහත සැපයුම්කරු සඳහා 2022 ජුනි 03 සිට 2024 ජුනි 02 දක්වා කාලය සඳහා ව්‍යාපාර බලපත්‍රය නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, 2023/2024 සහ 2024/2025 වාරය සඳහා ගල් අඟුරු මෙට්‍රික් ටොන් 1,390,342 ක් වලංගු ව්‍යාපාර බලපත්‍රයක් නොමැතිව සපයා තිබුණි. | මේ සම්බන්ධයෙන්, අතිරේකය අත්සන් කිරීම පහසු කිරීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පොටෙන්ෂියා එල්එල්සී හි ව්‍යාපාර ලියාපදිංචිය සහ සමාගම් ලිපිනය හා අධ්‍යක්ෂ තොරතුරු ඇතුළුව ප්‍රධාන ආයතනික තොරතුරු සත්‍යාපනය කරන ලදි. තවද, ගල් අඟුරු ආශ්‍රිත ගෙවීම්වල නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා සහ පොටෙන්ෂියා එල්එල්සී වෙත කිසිදු සම්බාධක හෝ නැව් තහනමක් අදාළ නොවන බව තහවුරු කර ගැනීම සඳහා ලංකා බැංකුව ස්වාධීනව මෙම ලේඛන එම ශ්‍රී ලාංකික අධිකාරිය හරහා සත්‍යාපනය කර ගන්නා ලදි. | බලපත්‍ර රහිත සේවා සපයන්නෙකු සමඟ සම්බන්ධ වීම වැළැක්වීම සඳහා සැපයුම්කරුගේ බලපත්‍ර සත්‍යාපනය සහ අධීක්ෂණ ක්‍රියාවලිය ස්ථාපිත කළ යුතුය. |
| (iii) | ඉහත නම් කරන ලද සැපයුම්කරුගේ නිල ලිපිනය ව්‍යාපාරික මධ්‍යස්ථානය 1, එම් මහල, ද මේඩාන් හෝටලය, නාඩ් අල් ෂෙබා, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය වුවද, විගණනයට ඩුබායි හි නාඩ් අල් ෂෙබා හි | ඉහත (ii) පිළිතුර බලන්න, වැඩිදුර සත්‍යාපනය සහ විනිවිදභාවය සඳහා එම විමසුම සම්බන්ධයෙන් අප විසින් විධිමත් ලෙස විද්‍යුත් තැපෑලෙන් පැහැදිලි කිරීමක් සහ නිදහසට කරුණු ඉල්ලා ඇත. | ලිපින වෙනස්කම් සත්‍යාපනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මේඩාන් හෝටලයෙන් ලද විද්‍යුත් තැපැලට අනුව, ඒ අවස්ථාවේ එම පරිශ්‍රයේ එවැනි කාර්යාලයක් නොතිබුණි. | | |
| (iv) | 2024 මාර්තු 08 වන දින බ්ලැක් සැන්ඩ් කොමොඩිටීස් එල්.එල්.සී (බී.එස්.සී) විසින් කරන ලද අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාවට අනුව, ඉහත ඉතිරි ප්‍රමාණය සැපයීම සඳහා බී.එස්.සී විසින් පොටෙන්ෂියා එල්.එල්.සී. එෆ්. ඉසෙඩ් නම් කරන ලෙස ඉල්ලා තිබූ අතර, ඉහත ප්‍රමාණය සැපයීමේ වගකීම හුවමාරු කිරීම සඳහා 2024 මාර්තු 18 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඉහත නම් කරන ලද සැපයුම්කරු ඉහත අනුමත කිරීම්වලට පෙර එනම් 2024 ජනවාරි 27 වන දින ගල් අඟුරු සැපයීම ආරම්භ කර තිබුණි. | මෙම සැපයුම බ්ලැක් සැන්ඩ් කොමොඩිටීස් හි අඛණ්ඩ කොන්ත්‍රාත්තුවේ කොටසක් වූ අතර, අවශ්‍ය ගල් අඟුරු ප්‍රමාණයන් නියමිත වේලාවට ලබා දීම සහතික කිරීම සඳහා බාධාවකින් තොරව මෙහෙයුම් දිගටම කරගෙන යාම අත්‍යවශ්‍ය විය. ඒ වන විට, බී.එස්.සී විසින් සකස් කරන ලද ගල් අඟුරු යාත්‍රා තුනක් ශ්‍රී ලංකාවේ ගොඩබෑමේ නැංගුරමට ඇතුළු කර තිබූ බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. බී.එස්.සී හි පැවරුම්කරු ලෙස, කොන්ත්‍රාත්තුව යටතේ ඉතිරි ගල් අඟුරු ප්‍රමාණය සැපයීමේ වගකීම පොටෙන්ෂියා එල්.එල්.සී භාර ගන්නා ලදි. කෙසේ වෙතත්, එල්.සී.සී විසින් අදාළ නීතිමය සහ රජයේ අනුමැතිය පළමුව ලබා ගැනීමෙන් තොරව ස්වාධීනව කටයුතු කිරීම හෝ කිසිදු ගෙවීමක් සඳහා අවසර දී නොමැත. | ඉදිරියට යාමට පෙර අදාළ බලධාරීන්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (v) | ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (SCAPC) ගල් අඟුරු සැපයුම්කරු ලෙස පොටෙන්ෂියා එල්.එල්.සී. එෆ්. ඉසෙඩ් ලියාපදිංචි කිරීමට නිර්දේශ කර නොතිබූ අතර, ලබා දී ඇති නීතිමය මතයට අනුව, පසුගිය වසර තුන සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, වර්ෂය තුළ එ.ජ.ඩො මිලියන 150 ක පිරිවැටුමක් ඉපයීම සහ පසුගිය ගල් අඟුරු සැපයුම් සඳහා අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද යන අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම හේතුවෙන් ඉහත සැපයුම්කරු ලියාපදිංචි නොකළ යුතු බව සඳහන් විය. | සටහන් කර ගන්නා ලදි. | සෑම ප්‍රසම්පාදනයකදීම සැපයුම්කරුගේ පූර්ව සුදුසුකම්, පළපුරුද්ද සහ හැකියාව ඇගයීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (vi) ලංසු ලේඛනයේ 3.20 වගන්තියට අනුකූලව ඉතිරි ගල් අඟුරු ප්‍රමාණය සැපයීම සඳහා ඉහත සමාගම බ්ලැක් සෑන්ඩ් කොමොඩිටීස් එල්.එල්.සී විසින් නම් කර තිබුණද, තෙවන පාර්ශවයක් නම් කිරීම සඳහා ඉහත වගන්තියේ එවැනි විධිවිධාන සපයා නොතිබුණි. | විදුලිබල අමාත්‍යාංශය හරහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද මඟ පෙන්වීම එල්.සී.සී අනුගමනය කරන ලදි. | සැපයුම්කරුවන් තෝරා ගැනීම ද ලංසු ලේඛනවලට අනුකූල විය යුතුය. |
| (vii) පොටෙන්ෂියා එල්.එල්.සී. එෆ්.ඉසෙඩ් විසින් එහි අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුට තම සමාගම වෙනුවෙන් කටයුතු කිරීමට බලය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, එම අධ්‍යක්ෂවරුන් සමාගමේ කොටස් හිමියන් වූ අතර ඒ.ඊ.ඩී 100,000 ක් වන ආසන්න වශයෙන් රු. 8,840,000 ක් වන මුළු කොටස් 100 න් සියයට 50:50 ක කොටස් හිමිකාරිත්වයක් ඇති අතර සමාගමේ (පොටෙන්ෂියා එල්.එල්.සී.) හිමිකාරිත්වය ඉහත අධ්‍යක්ෂවරුන් දෙදෙනාට හිමිව තිබූ අතර ඔවුන් ශ්‍රී ලාංකික ජාතිකයින් විය. මෙම තත්ත්වය මතභේදාත්මක විය. | ඉහත (ii) පිළිතුර බලන්න, වැඩිදුර සත්‍යාපනය සහ විනිවිදභාවය සඳහා එම විමසුම සම්බන්ධයෙන් අප විසින් විධිමත් ලෙස විද්‍යුත් තැපැලෙන් පැහැදිලි කිරීමක් සහ නිදහසට කරුණු ඉල්ලා ඇත. | එක් එක් ලංසු ලේඛනයට අනුකූලව සෑම සැපයුම්කරුවෙකුගේම සුදුසුකම් ඇගයීමට ලක් කළ යුතුය. |
| ආ) 2024/2025 සහ 2025/2026 වාරය සඳහා ගල් අඟුරු මෙට්‍රික් ටොන් 2,250,000ක් සැපයීම සඳහා 2024 අප්‍රේල් 02 දින හෝ ඊට පෙර ලංසු ඉදිරිපත් කරන ලෙස සමාගම විසින් ලංසුකරුවන්ට ආරාධනා කර තිබුණි. 2024 අප්‍රේල් 02 දිනට පෙර ලංසු හයක් ලැබී තිබුණි. SCAPC තීරණවලට අනුව, ලංසු තැබීමේ කාලය 2024 ජූලි 08 දක්වා හතර වතාවක් දීර්ඝ කර තිබුණි. තවද, වත්මන් සැපයුම්කරු වන පොටෙන්ෂියා එල්.එල්.සී 2024 ජූලි 08 වන දිනයේම එ.ජ.ඩො 121.82 අනුපාතයක් යටතේ ගල් අඟුරු මෙට්‍රික් ටොන් 2,250,000 ක් | | |

සැපයීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, පොටෙන්ෂියා එල්.එල්.සී වෙතින් ලද යෝජනාව සලකා බැලීමෙන් තොරව එ.ජ.ඩො 135.59 ක අනුපාතයක් යටතේ ගල් අඟුරු ප්‍රමාණය සැපයීම සඳහා වන කොන්ත්‍රාත්තුව ආදිත්‍ය බිර්ලා ග්ලෝබල් ට්‍රේඩින් (සිංගප්පූරු) පීටීඊ ලිමිටඩ් වෙත ප්‍රදානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. 2024 අගෝස්තු 05 වන දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ඉහත ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කර එහි නිර්දේශ සහිත සවිස්තර වාර්තාව ලබා ගැනීම සඳහා උප කමිටුවක් පත් කරන ලදි. ලංසු ලේඛනයේ 2.7.1 වගන්තියට අනුව, 2024 ජූලි 08 වන දින විවෘත කරන ලද ගල් අඟුරු මෙට්‍රික් ටොන් 2,250,000 ක් සැපයීම සඳහා 2024 පෙබරවාරි 20 වන දින ඇරයුම් කරන ලද ටෙන්ඩර් ක්‍රියාවලිය අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උප කමිටුව නිර්දේශ කර තිබූ අතර, ඉහත ප්‍රමාණය මෙට්‍රික් ටොන් එකකට එ.ජ.ඩො 121.82 ක අනුපාතයක් යටතේ සැපයීම සඳහා වත්මන් සැපයුම්කරු වන පොටෙන්ෂියා එල්.එල්.සී. වෙත ටෙන්ඩර් ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ අත්පොත අනුව අනුකූල නොවීම පහත පරිදි වේ.

**2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොතට අනුකූල නොවීම.**

(i) ප්‍රසම්පාදන අත්පොතෙහි 3.12 ඡේදයට අනුව, සාමාන්‍යයෙන් විශාල හා සංකීර්ණ වැඩ, කාර්ය නිෂ්ඨාපර (Turnkey) බලාගාර, පෞද්ගලික අංශයේ යටිතල පහසුකම් ව්‍යාපෘති, සමහර විශේෂ භාණ්ඩ සහ සංකීර්ණ තොරතුරු

ඒ අවස්ථාවේ පැවති භූ දේශපාලනික තත්ත්වය හේතුවෙන් එක්සත් ජනපදය විසින් පනවන ලද සම්බාධක හේතුවෙන්, පොටෙන්ෂියා එල්.එල්.සී එෆ්.ඉසෙඩ් සමාගම බ්ලැක් සැන්ඩ් කොමොඩිටීස් එල්.එල්.සී විසින් පවරන ලදි.

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ අත්පොතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

| | | | |
|---|---|---|---|
| | තාක්ෂණ පද්ධති සඳහා පූර්ව සුදුසුකම් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, තෝරාගත් සැපයුම්කරු ඉහත අවශ්‍යතාවය සපුරා තිබුණද, ඉහත ඡේදයේ අවශ්‍යතාවයට අනුව පොටෙන්ෂියා එල්.එල්.සී එෆ්.ඉසෙඩ් විසින් පූර්ව ලංසු සුදුසුකම් ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන ලද අනුමැතීන් මත පදනම්ව, රේඛීය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව, අදාළ සියලු ක්‍රියාමාර්ග ලංකා ගල් අඟුරු සමාගම විසින් සිදු කරන ලදි. නීතිපති දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ නිර්දේශ ඇතුළත් කරමින්, ක්‍රියාවලිය නිසි ක්‍රියා පටිපාටියට අනුකූල විය.<br>එබැවින්, මෙම නිරීක්ෂණයේ සඳහන් කර ඇති ඕනෑම අඩුපාඩුවක් සැලකිල්ලට ගෙන අනාගත ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හිදී විසඳනු ඇත. | |
| (ii) | 5.3.11 (අ) ඡේදයට අනුව, සියලුම ලංසුකරුවන් විසින් නියමිත ආකෘතියේ ලංසු සුරැකුමක් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, පොටෙන්ෂියා එල්.එල්.සී එෆ්.ඉසෙඩ් විසින් මෙට්‍රික් ටොන් එකකට එ.ජ.ඩො 94.82 ක එෆ්.ඕ.බී අනුපාතයක් යටතේ සහ මෙට්‍රික් ටොන් එකකට එ.ජ.ඩො 27 ක පදනම් නැව් ගාස්තුවකට එ.ජ.ඩො 2,740,950 ක ගල් අඟුරු මෙට්‍රික් ටොන් 2,250,000 ක සැපයුම සඳහා ලංසු සුරැකුම ඉදිරිපත් කර නොතිබුණි. | පොටෙන්ෂියා ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවන බැවින් ටෙන්ඩර් ක්‍රියාවලියට සහභාගී වී නොමැත. එසේ තිබියදීත්, ඔවුන් අමාත්‍යාංශයට සෘජුවම යෝජනාවක් ඉදිරිපත් කර ඇත. නිල ටෙන්ඩර් ක්‍රියාවලියට පොටෙන්ෂියා සම්බන්ධ නොවූ බැවින්, ලංසු සුරැකුම සැපයීමට හෝ රඳවා ගැනීමට අපට ඔවුන්ගෙන් ඉල්ලා සිටිය නොහැක. එබැවින්, ඔවුන්ගේ යෝජනාවට අදාළ සියලු කටයුතු අමාත්‍යාංශය සහ අමාත්‍ය මණ්ඩලය විසින් පමණක් හසුරුවයි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ අත්පොතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (iii) | 5.4.10 (ඇ) ඡේදයට අනුව, ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට නොඅඩු සුදුසු වටිනාකමකින් යුත් කාර්ය සාධන සුරැකුමක් වගකීම් බැඳීම් ද ආවරණය කළ හැකිය. කෙසේ වෙතත්, සමාගම විසින් මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ට සමාන කාර්ය සාධන සුරැකුමක් ලබාගෙන නොතිබුණි. තවද, ආරම්භයේදීම, පොටෙන්ෂියා එල්.එල්.සී එෆ්.ඉසෙඩ් වෙත පසුගිය සැපයුම් සඳහා ගෙවිය යුතු මුදලට (එනම්, පෙර සැපයුම්කරුගෙන් ලංසු | එ.ජ.ඩො. 27,409,500.00 ක කාර්ය සාධන සුරැකුමට එරෙහිව පවතින අරමුදල්වල විස්තර පහත දක්වා ඇත. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ අත්පොතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| කාර්යසාධන සුරැකුම් සඳහා රඳවා ගත් අරමුදල් | එ.ජ.ඩො | එ.ජ.ඩො |
|---|---|---|
| පවත්නා කාර්යසාධන සුරැකුම | | 13,950,000.00 |
| සම්පිණ්ඩිත හානි ගාස්තු ගෙවීම් අරමුදල් (MV YANGTZE IMPRESSION හි සියයට 80 ක්) | | 5,418,645.06 |
| ගෙවිය යුතු ඩිස් ගෙවීම් - 2023/2024 වර්ෂය | | |
| MV VANIZIA | 864,248.82 | |
| MV HUA RONG -26 | 1,002,159.93 | |
| MV GENOA | 798,493.24 | |
| MV PANEMORFI | 831,138.69 | |
| MV YANGTZE IMPRESSION | 754,795.87 | 4,250,836.55 |
| 2024/2025 වර්ෂයේ ඉතිරි ගෙවීම් | | |
| 439/33 – MV HUA RONG 26 | 1,502,619.88 | |
| 443/37 - MV BAOSHAN GLORY | 1,220,765.57 | |
| 444/38 – MV CHANG CHANG DON | 1,219,521.71 | 3,942,907.16 |
| කාර්යසාධන සුරැකුම් සඳහා ඇති මුළු අරමුදල් | | **27,562,388.77** |

| | | |
|---|---|---|
| සුරැකුම ලෙස ලබාගත් මුදල් තැන්පතුව, සම්බාධක ගැටළුවක් හේතුවෙන් බ්ලැක් සැන්ඩ් කොමොඩිටීස් වෙත ආපසු ගෙවිය යුතු මුදල් සහ පොටෙන්ෂියා එල්.එල්.සී විසින් සපයන ලද අවසන් නැව් බඩු තොග තුන හෝ හතර සඳහා පියවිය යුතු වටිනාකමට සමාන මුදලක්) එරෙහිව කාර්ය සාධන සුරැකුම සමාගම විසින් ආවරණය කර ගෙන තිබුණි. | සැපයුම්කරුගේ ඉල්ලීම් ලිපිය අනුගමනය කරමින් සහ ලං.වි.ම හි කැමැත්ත ඇතිව, කාර්ය සාධන සුරැකුම සමාගම විසින් සම්පූර්ණයෙන්ම ආවරණය කර ගෙන ඇත.<br>ඉතිරි ගෙවීම් පියවීම වෙනුවට, එම අරමුදල් කාර්ය සාධන සුරැකුම ලෙස තබා ගැනීමට ගත් තීරණය සමාගමට වඩා ලාභදායී වේ. ඉතිරි ගෙවීම් පියවීම සඳහා බැංකු ණයක් ලබා ගැනීමට අවශ්‍ය වන අතර එමඟින් අමතර මූල්‍ය වියදම් දැරීමට සිදුවීම මෙයට හේතුව වේ. | |
| (iv) LLC/prop/23/1 (පසුගිය සැපයුම) යටතේ ඉතිරි ගල් අඟුරු ප්‍රමාණය සැපයීමේ වත්මන් සැපයුම්කරු වූ පොටෙන්ෂියා එල්.එල්.සී එෆ්.ඉසෙඩ් විසින් දීර්ඝ කරන ලද ලංසු කාල සීමාව අවසන් වූ 2024 ජූලි 08 වන දින 2024/2025 සහ 2025/2026 ඊළඟ වාරය සඳහා මෙට්‍රික් ටොන් 2,250,000 ක් මෙට්‍රික් ටොන් එකකට එ.ජ.ඩො 121.82 ක් යටතේ සැපයීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉහත යෝජනාව ඇගයීමකින් තොරව ලංසු 06 ක් ඇගයීමට ලක් කර තිබුණි. තවද, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපකමිටුව, පොටෙන්ෂියා එල්.එල්.සී එෆ්.ඉසෙඩ් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සමඟ ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා තෝරාගත් ආදිත්‍යා බිර්ලා ග්ලෝබල් ට්‍රේඩින් (සිංගප්පූරුව) විසින් ඉදිරිපත් කරන ලද අඩුම සාරානුකූල ලංසුව ඇගයීමට ලක් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව අවංකභාවයේ | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අනුකමිටුවේ නිර්දේශ සහ පසුව ගත් අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, රේඛීය අමාත්‍යාංශය විසින් සපයන ලද උපදෙස්වලට අනුකූලව අපි ක්‍රියා කර ඇත. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ අත්පොතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

ප්‍රසම්පාදන මූලධර්මයට පටහැනිව ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිය සහ යෝජනාව මගින් ඉදිරිපත් කරන ලද ගල් අඟුරුවල මිල ඇගයීමට ලක් කර තිබුණි.

(v) වත්මන් සැපයුම්කරුගේ ගල් අඟුරු ඒකක මිලට සාපේක්ෂව අඩුම ලංසුකරුගේ ගල් අඟුරු ඒකක මිල ඉහළ යාම සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අනුකමිටුව විසින් ලබා දුන් නිර්දේශය අනුව වත්මන් සැපයුම්කරුගේ මිල යෝජනාව මත පදනම්ව සමාගමේ ලියාපදිංචි නොකළ සැපයුම්කරුවෙකු වන වත්මන් සැපයුම්කරු තෝරාගැනීම හේතුවෙන් සමාගම විසින් ඉහත තක්සේරු කරන ලද කාලීන ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත ප්‍රසම්පාදනය සඳහා ලංසු ආපසු කැඳවීමකින් තොරව ප්‍රසම්පාදනය වත්මන් සැපයුම්කරුට ප්‍රදානය කර තිබුණි.

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අනුකමිටුවේ නිර්දේශ සහ පසුව ගත් අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, රේඛීය අමාත්‍යාංශය විසින් සපයන ලද උපදෙස්වලට අනුකූලව අපි ක්‍රියා කර ඇත.

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ අත්පොතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(vi) පෙර ලංසු ලේඛනවලට අනුව ණයවර ලිපි ක්‍රමය (LC )භාවිතා කරමින් සමාගම ගල් අඟුරු සැපයුම්කරුවන්ට ගෙවීම් සිදු කර තිබුණි. පසුව, 2022 නොවැම්බර් 21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, ණයවර ලිපිය වෙනුවට හදිසි සහ සුවිශේෂී තත්ත්වය හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව වෙනත් ගෙවීම් ක්‍රම එනම් විලම්බිත ගෙවීම්/ අනේවාසික රුපියල් ගිණුම (NRRA)/එස්ක්‍රෝ/ශ්‍රී ලංකා රුපියල හෝ වෙනත් ගෙවීම් ක්‍රම සහ ගෙවීම් නියමයන් හරහා ගෙවීම් සිදු කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව සමාගම අඛණ්ඩව විදුලි පණිවුඩ හුවමාරු ක්‍රමය (TT) හරහා සැපයුම්කරුවන්ට ගෙවීම්

සටහන් කර ගෙන ඇත. ණයවර ලිපි (LC) ක්‍රමය සැපයුම්කරුට සහ ගැනුම්කරුට ආරක්ෂාව සපයන අතර, විදුලි පණිවුඩ හුවමාරු (TT) ගෙවීම් ක්‍රමය ගැනුම්කරුට වඩාත් ආරක්ෂිත සහ ලාභදායී බව සැලකිල්ලට ගත යුතුය. මෙය පහත වගුවේ තවදුරටත් විස්තර කර ඇත.

| වාරයකට ණයවර ලිපි ගාස්තු | | | | | |
|---|---|---|---|---|---|
| ණයවර ලිපි ගාස්තු | [illegible] | [illegible] සඳහා ණයවර ලිපි ගාස්තු මුදල | නැව් බඩු තොගයකට | මුළු නැව් බඩු තොග සංඛ්‍යාව | මුළු ගාස්තු මුදල එ.ජ.ඩො |
| ණයවර ලිපි - ගෙවන ලද වියදම | | 57,458.94 | 57,458.94 | 38 | 2,183,439.72 |
| වසර සඳහා මුළු ණයවර ලිපි ගාස්තු - එ.ජ.ඩො | | | | | 2,183,439.72 |
| වාරය සඳහා විදුලි පණිවුඩ හුවමාරු (TT) ගාස්තු | | | | | |
| | | | නැව් බඩු තොගයකට | මුළු නැව් බඩු තොග සංඛ්‍යාව | මුළු ගාස්තු මුදල එ.ජ.ඩො |
| TT ගාස්තු | | | 81.01 | 38 | 3,078.38 |
| වසර සඳහා මුළු TT ගාස්තු - එ.ජ.ඩො | | | | | 3,078.38 |

විශේෂයෙන් ජාත්‍යන්තර වෙළඳ අවස්ථාවලදී ණයවර ලිපි ක්‍රමය වඩාත් ආරක්ෂිත බැවින්, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය.

| | | | |
|---|---|---|---|
| | සිදු කර තිබුණි. තවද, TT ක්‍රමයට වඩා LC ක්‍රමය යටතේ බැංකුවෙන් සම්පූර්ණ ඇපකරයක් ලැබෙන බැවින් LC ක්‍රමයට සාපේක්ෂව ආරක්ෂිත ක්‍රමයක් නොවන TT හැර LC වැනි ඉහළ ආරක්ෂිත ගෙවීම් ක්‍රමයක් කෙරෙහි සමාගම අවධානය යොමු කර නොතිබුණි. | ඒ අනුව, LC ගෙවීම් ක්‍රමයට සාපේක්ෂව TT ගෙවීම් ක්‍රමය වැඩි වාසි ලබා දෙයි. | |
| (vii) | ඉහත තෝරාගත් අඩුම ලංසුකරුට වඩා ගල් අඟුරු මිල අඩු වුවද, ගල් අඟුරුවල කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා පෙර ගල් අඟුරු සැපයුම සහ විගණිත දිනය දක්වා වූ (2024 මැයි 31) වත්මන් ගල් අඟුරු සැපයුම හා සසඳන විට ගල් අඟුරු මත පදනම් වූ බලශක්ති ජනනයේ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි සහ තොරතුරු විගණනයට ලබා දී නොතිබුණි. | ලක්විජය බලාගාරය සඳහා අවශ්‍ය ගල් අඟුරු පිරිවිතරයන් ලංසු ලේඛනයේ පැහැදිලිව දක්වා ඇත. සපයන ලද ගල් අඟුරු නිශ්චිත ප්‍රමිතීන්ගෙන් බැහැර වන අවස්ථාවන්හිදී, ගුණාත්මකභාවය සහ ප්‍රමාණය මත පදනම් වූ මිල ගැලපීම් යෙදෙන ප්‍රධාන පරාමිතීන් හතක් ඇත. මෙම පරාමිතීන් සහ ඒවායේ අදාළ ගැලපුම් සූත්‍ර ලංසු ලේඛනයේ විස්තර කර ඇත. එබැවින්, ගල් අඟුරු වෙනස් කලාපයකින් ලැබුණත්, සපයන ලද තත්‍ය ගුණාත්මකභාවය මත පදනම්ව මිල ගැලපුම් යාන්ත්‍රණය හරහා ගුණාත්මකභාවයේ ඕනෑම විචලනයක් විසඳුනු ඇත. එබැවින්, මිලකරණ යාන්ත්‍රණය ගුණාත්මකභාවයේ වෙනස්කම් සැලකිල්ලට ගන්නා බැවින් සැපයුම් මූලාශ්‍රයේ වෙනසක් හේතුවෙන් මිල වෙනසක් ඇති නොවේ. | ගල් අඟුරුවල කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා ගල් අඟුරු පරීක්ෂාව සිදු කළ යුතුය. ඒවායේහි ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |